සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 9 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | 11 | S | I,II |
|---|---|---|---|---|

නම: .............................................   **බුද්ධ ධර්මය**   කාලය පැය දෙකයි

★ සැලකිය යුතුයි.
★ පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
★ එක් ප්‍රශ්නයකට ලකුණු දෙක බැගින් හිමි වේ.
★ දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

**★ අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) අධි ශීල, අධි චිත්ත, අධි ප්‍රඥාවෙන් යුක්තව ඍජු ප්‍රතිපත්තියෙහි යෙදෙන බැවින් සංඝ රත්නය,
1. සුපටිපන්න වන සේක.   2. උජුපටිපන්න වන සේක.
3. ඤායපටිපන්න වන සේක.   4. සාමීචිපටිපන්න වන සේක.

02) භික්ෂූන් වහන්සේ විසින් ගිහියා කෙරෙහි ධර්ම දානයෙන් ප්‍රතිඋපකාර කළ යුතු යැයි බුද්ධ දේශනාවේ සඳහන් කරුණු සංඛ්‍යාත්මකව,
1. පහ කි.   2. හය කි   3. හත කි.   4. එකොළහ කි.

03) භද්දකච්චානා තෙරණිය පිරිනිවන් පාන්නට තීරණය කරනු ලැබුවේ බුදු හිමි,
1. විශාලා මහනුවර කූටාගාර ශාලාවේ වැඩ සිටියදී.   2. බේලුව නම් ගමෙහි වැඩ සිටියදී.
3. නාලක නම් ගමෙහි වැඩ සිටියදී.   4. චාපාල චෛත්‍ය නම් ස්ථානයේ වැඩ සිටියදී.

04) බුදුරජාණන් වහන්සේ දෙවියන්ට පමණක් දේශනා කර ඇති සූත්‍ර ඇතුළත් වරණය වන්නේ,
1. මහා සමය සූත්‍රය, පරාභව සූත්‍රය, නන්දකෝවාද සූත්‍රය.
2. මහා මංගල සූත්‍රය, සිඟාලෝවාද සූත්‍රය, පරාභව සූත්‍රය.
3. සිඟාලෝවාද සූත්‍රය, නන්දකෝවාද සූත්‍රය, මහා සමය සූත්‍රය.
4. පරාභව සූත්‍රය, මහා සමය සූත්‍රය, මහා මංගල සූත්‍රය.

05) සැවැත් නුවර විසූ චුල්ලකාල නම් උපාසකගේ කතා වස්තුව තුළින් ප්‍රකට වන්නේ,
1. අයහපත් මිතුරන් ආශ්‍රය තුළින් තමාද පිරිහීමට පත්වන බවයි.
2. වැරදි කිරීම තුළින් හෘද සාක්ෂිය අනුව තමා වැරදිකාරයකු වන බවයි.
3. ධර්මය ආරක්ෂා කරන්නා ධර්මය විසින් රකින බවයි.
4. අකුසල ක්‍රියා සිදු කිරීමෙන් එහි ප්‍රතිවිපාක විඳීමට සිදුවන බවයි.

**★ ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

**(සබරගමුව, අර්ධ, ඔක්කප්පන, විභව තණ්හාව, භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය)**

06) බුද්ධාදි රත්නත්‍රය පිළිබඳ ඇති දිව්‍ය, බ්‍රහ්ම, මාර, මනුෂ්‍ය ආදි කිසිවෙකුටත් නොසෙල්විය හැක්කේ ................................................ සද්ධාව ය,

07) ශ්‍රී පාදස්ථානය පිහිටා ඇත්තේ ................................................ පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ ය.

08) ආනාපානසති භාවනාව ප්‍රගුණ කිරීමේදී ගැහැණු දරුවන් ................................................ පර්යංකයෙන් සිටීම වඩාත් සුදුසු ක්‍රමය වේ.

09) භික්ෂුණීන් වහන්සේලාගේ විනය පවත්වා ගෙන යාමට අදාළ .................................................. පනවන ලද්දේ ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ ඉල්ලීම අනුවය.

10) සියල්ල මරණයෙන් කෙළවර වේ යැයි සිතා මෙලොව හැකිතාක් සැප විඳීමට ඇති ආශාව .................................... ලෙස හැඳින්වේ.

**★ ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශය හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියේ දී ඇති වරහන තුළ යොදන්න.**

11) යසෝදරාවත යනු යසෝදරා දේවියගේ පතිභක්තිය ප්‍රකාශිත කාව්‍ය නිර්මාණයකි. ( )

12) අන් අයගේ දියුණුව දැක එම දියුණුව තමාට වූවා සේ සලකා සතුටට පත්වීම උපේක්ෂාවයි. ( )

13) තෙවන ධර්ම සංගායනාවෙන් පසු තම්බපණ්ණියට වැඩම කරන ලද්දේ මහාදේව හිමි ඇතුළු පිරිසය. ( )

14) සිගාලක ගෘහපති පුත්‍රයාට බුදුන් වහන්සේ දේශනා කළ පරිදි උපයන ධනය විනාශ වන කරුණු සයකි. ( )

15) බුද්ධ දේශනාව අනුව දිළින්දන්ට ආර්ථික පහසුකම් නොසලසන විට දිළිඳුකම වැඩි වේ. ( )

**★ ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට "අ" තීරුවට ගැළපෙන ප්‍රකාශය "ආ" තීරුවෙන් තෝරා පිළිතුරට අදාළ අක්ෂරය වරහන් තුළ යොදන්න.**

| "අ" කොටස | | "ආ" කොටස |
|---|---|---|
| 16) කර්මවාදියෙකි | ( ) | A අනවජ්ජ සැපය. |
| 17) දුසිරිත් නොකර සිටීම | ( ) | B පටිච්ච සමුප්පාදය. |
| 18) නිවන් මගට නමකි | ( ) | C සේව්‍ය සේවක යුතුකම්. |
| 19) ඉමස්මිං සති ඉදං හෝති | ( ) | D ජෛන මහාවීර තුමා . |
| 20) සෞඛ්‍ය පහසුකම් සලසා දීම | ( ) | E ඤායය. |

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

★ සැළකිය යුතුයි.
★ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
★ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
★ පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද 02 සිට 07 දක්වා ප්‍රශ්න වලට ලකුණු 10 බැගින් ද හිමිවේ.

01) කෙටි පිළිතුරු සපයන්න.

i. පරිනිර්වාණ සමයේ දී බුදු හිමියන්ට වැළඳුණ රෝගය කුමක්ද ?
ii. යසෝදරා දේවියගේ දෙමාපියන් නම් කරන්න.
iii. ''මිනිසත් බව දුර්ලභය'' යන අදහස පාලියෙන් දක්වන්න.
iv. සීලයේ ප්‍රභේද දෙක සඳහන් කරන්න.
v. සතර අගතියට අයත් කරුණු අතුරෙන් දෙකක් ලියන්න.
vi. තෙරුවන් කෙරෙහි ඇති කරගන්නා නිසි පැහැදීම කුමන නමකින් හැඳින්වේ ද ?
vii. බුදු සසුනෙහි අග්‍ර ශ්‍රාවක දෙනම නම් කරන්න.
vii. බුදු දහමින් ප්‍රතික්ෂේප කර ඇති වෙළෙඳාම් අතුරෙන් දෙකක් ලියන්න.
ix. බෞද්ධ සිද්ධස්ථානයක පියගැට පෙළ පාමුල පිහිටි අර්ධ කවාකාර ගල් පඩිය කුමන නමකින් හැඳින්වේ ද?
x. කිසිදු සත්ත්වයකු නොමැරිය යුතු බවට මාඝාත ආඥාව පනවන ලද්දේ කවුද? (ලකුණු 2 x 10 = 20)

02) i. අටලෝ දහමින් කම්පා නොවීම මංගල කරුණක් බව දක්වන ගාථාව ලියන්න. (ලකුණු 02)
ii. අටලෝ දහම නිවැරදිව නම් කරන්න. (ලකුණු 03)
iii. එයින් කරුණු දෙකක් පිළිබඳව බුදු සිරිතෙන් උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 05)

03) i. බුදුරජාණන් වහන්සේ කර්මය පිළිබඳව දේශනා කළේ කාහට ද? (ලකුණු 02)
ii. ''චේතනාහං භික්ඛවේ කම්මං වදාමි.............'' යන පාලි පාඨය ලියා දක්වන්න. (ලකුණු 03)
iii. කුසල ක්‍රියා දහය නම් කොට තිදොරෙහි බෙදා දක්වන්න. (ලකුණු 05)

04) i. දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට හේතුව කුමක් ද? (ලකුණු 02)
ii. දෙවන ධර්ම සංගායනාව පැවැත් වූ ස්ථානය, මූලිකත්වය හා සහභාගී වූ රහතන් වහන්සේලා ප්‍රමාණය සඳහන් කරන්න. (ලකුණු 03)
iii. දෙවන ධර්ම සංගායනාවෙන් ලැබූ ප්‍රතිඵල තුනක් සඳහන් කර එක් කරුණක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

05) i. සියලු ප්‍රාණීන්ගේ ජීවිතයේ සුරක්ෂිත බව තහවුරු කරන සිල් පදය කුමක් ද? (ලකුණු 02)
ii. සියලු ජීවීන් දඬුවමට බිය බවත්, ජීවිතයට ප්‍රිය බවත් දක්වන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 03)
iii. සියලු සතුන්ට ජීවත්වීමේ අයිතිය බුදු දහමින් ලබා දී ඇති ආකාරය නිදසුන් සහිතව දක්වන්න. (ලකුණු 05)

06) i. පැරණි විහාරවල බිතු සිතුවම් ඇඳීම සඳහා මූලාශය වී ඇත්තේ මොනවා ද? (ලකුණු 02)
ii. පොළොන්නරු යුගයට අයත් සාහිත්‍ය ග්‍රන්ථ දෙකක් නම් කරන්න. (ලකුණු 03)
iii. බෞද්ධ සාහිත්‍ය කෘති පරිශීලනයෙන් මෙරට ජන ජීවිතය වෙනස් වූ ආකාරය පහදන්න. (ලකුණු 05)

07) පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.
i. ගිහි පැවිදි යුතුකම්
ii. නීරෝගි බව උතුම් ලාභයයි
iii. සීලයෙහි ත්‍රිකෝටික පාරිශුද්ධිය
iv. සම්මා ආජීවය (ලකුණු 5 x 2 = 10)